# කාර්ය සාධන වාර්තාව - 2016

## ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව


1. දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම්

2. දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ

3. ආංශික කාර්යය සාධනය

   **3.1** සාර්ව ආර්ථික සංවර්ධනය

   **3.2** කෘෂිකර්ම,වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර

   **3.3** කර්මාන්ත හා වෙළඳ,විදුලි බල හා බලශක්ති

   **3.4** මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන

   **3.5** නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර

   **3.6** සෞඛ්‍ය හාදේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික

   **3.7** අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරු තාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ

   **3.8** ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ

   **3.9** රාජ්‍ය කළමනාකරණය හා පාලන

   **3.10** විමධ්‍යගත අයවැය

**4.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**5.** මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**6.** මූල්‍ය කාර්ය සාධනය

# 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

දැයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

**(i)** ජාතික හා ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහාය වීම.

**(ii)** මධ්‍ය කාලීන අයවැය රාමුව සකස් කිරීම:රාජ්‍ය ආයෝජන වැඩසටහන.

**(iii)** ව්‍යාපෘති ඇගයීම.

**(iv)** අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම.

**(v)** ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම: ව්‍යාපෘති පෙළගැස්ම.

**(vi)** සැලසුම් මාර්ගෝපදේශ සැකසීම.

**(vii)** උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැපසීම.

**(viii)** විමධ්‍යගත මූලධන අයවැය පාර්ශවකරුවන්ගේ දූත මෙහෙයන් කළමණාකරණය කිරීම.

**(ix)** විශේෂ පැවරුම්.

**(x)** කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධන.

**(xi)** පොදු පරිපාලනය.

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 08 කට වෙන් කර ඇත. එම අංශ 08 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත.එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

<u>දෙපාර්තමේන්තුවේ අංශ</u>

- සාර්ව ආර්ථික සංවර්ධනය
- කෘෂිකර්ම, වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර
- කර්මාන්ත හා වෙළඳ,විදුලි බල හා බලශක්ති
- මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන
- නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික
- අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරුතාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණය හා පාලන
- විමධ්‍යගත අයවැය

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

1. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය
2. පරිපාලන අංශය
3. මූල්‍ය අංශය

# 03. ආංශික කාර්ය සාධනය

## 3.1 සාර්ව ආර්ථික සංවර්ධනය

<u>සාර්ව ආර්ථික අංශයේ ප්‍රගතිය</u>

**2010-2015 කාල පරිච්ඡේදය තුළ ආර්ථික වර්ධනයේ ක්‍රියාකාරිත්වය**

2010-2015 කාල පරිච්ඡේදය තුළ සියයට 6.43ක සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයක් ළඟා කරගත හැකි විය. 2009 වසරේදී සිවිල් අර්බුදය අවසන් වීමත් සමඟ ඉහළ ආර්ථික වර්ධන වේගයකට අවශ්‍ය පරිසරය නිර්මාණය වීම සහ ඉදිකිරීම් අංශය ප්‍රසාරණය වීම යන තාවකාලික සාධක මෙම කාල පරිච්ඡේදය තුළ වාර්තා කරන ලද ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් හේත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2015 වසර වන විට ඒක පුද්ගල දළ දේශිය නිෂ්පාදිතය (ද.දේ.නි.) එක්සත් ජනපද (එ. ජ) විවිධ වෘත්තිමය කාණ්ඩ අතර මෙන්ම පළාත් අතර පැවති සැලතිය යුතු ආදායම් විෂමතාවයන් මෙම සමාන්‍ය අගයෙන් පිළිබිඹු නොවීය. එමෙන්ම මෙම කාල පරිච්ඡේදය තුළ දේශිය ආර්ථිකයේ උද්ධමනය තනි අගයක පැවතීම විශේෂයෙන් අඩු ආදායම්ලාභී කාණ්ඩවල මූර්ත ආදායම් සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමටද හේතුවිණි. මෙලෙස ආදායම් මට්ටම් ඉහළ යෑම පාර්භෝගික ඉල්ලුම සමස්ත ආර්ථික වර්ධනයේ ප්‍රධාන සාධකය විය. අපනයන ක්‍රියාකාරීත්වය තුළින් පිළිබිඹු වන විදේශිය ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමී වූ අතර, සංවර්ධිත කාර්මික රටවල ආර්ථික වර්ධනය අඩපණ කළ ලෝක ආර්ථික අවපාතය මෙකී විදේශිය ඉල්ලුමෙහි මන්දගාමී වර්ධනයට හේතු විය.

**කාර්ය සාධනය**

- වර්තමාන රජයේ මධ්‍යකාලීන දැකීම වන, රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළියෙල කර අවසන් කරන ලදී. එය පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. රාජ්‍ය ආයෝජන වැඩසටහනේ පිටපත් අදාල රජයේ ආයතන වලට ලබා දුන් අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන ලෙස දැනුම් දෙනු ලැබිණි.
- ආමාත්‍ය මණ්ඩල 5කට පිළිතුරු සපයන ලදී.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අඩංගු ''රාජ්‍ය ආයෝජන වැඩසටහන'' පරිච්ඡේදය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන ලදී.
- සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ වාර්තාව පිළියෙල කිරීම ආරම්භ කල අතර, මෙම වාර්තාව අවසන් කිරීම සඳහා උපදේශන සැසි පැවැත්වීමට බලාපොරොත්තු වේ.

## 3.2 කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, පශුසම්පත් හා ධීවර අංශ

<u>කෘෂිකාර්මික අංශය</u>

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය ප්‍රධාන වශයෙන් වැවිලි නොවන, වැවිලි, පශු හා ධීවර යන අංශ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. 1990 දී සියයට 26 ක්වූ දළ දේශිය නිෂ්පාදනයට ඇති දායකත්වය, 2015 වන විටදී සියයට 7.9 දක්වා අඩු වුවද කෘෂි ක්ෂේත්‍රය තවදුරටත් ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳුනාරටිය ලෙස ක්‍රියාකරයි. සාම්ප්‍රදායික කෘෂිකාර්මාන්තය කේන්ද්‍ර කරගත් ආර්ථිකයෙන් බැහැරව සේවා අංශය ප්‍රමුඛ කොටගත් ආර්ථික රටාවකට නැඹුරුවීම හරහා ක්ෂේත්‍රයේ සැලකිය යුතු ව්‍යුහාත්මක වෙනසක් පෙන්නුම් කළද, තවමත් ග්‍රාමීය හා වැවිලි අංශවල ජනගහනයෙන් බහුතරයක් (සියයට 70 ක් පමණ) කෘෂිකර්මාන්තයේ යෙදී සිටී.

<u>බෝග කෘෂිකර්මය</u>

බෝග කෘෂිකර්මය වී, එළවළු, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පළතුරු හා කුළු බඩු, විසිතුරු මල් හා පැල ඇතුලත් අපනයන කෘෂි බෝගවලින් සමන්විත වේ. වී නිෂ්පාදනය බෝග කෘෂිකර්මයෙහි ප්‍රමුඛතම ආර්ථික ක්‍රියාකාරකම වන අතර මිලියනයකට අධික ගොවීන් ප්‍රමාණයක් සෘජු හා වක්‍ර ලෙස වී නිෂ්පාදනයේ නිරත වී සිටී.
2016 වසරේ දී බෝග කෘෂිකර්ම සංවර්ධනය සඳහා රු. බිලියන 12 ක පමණ මුදලක් ප්‍රාග්ධන ආයෝජන ලෙස වෙන් කරන ලද අතර එයට අමතරව රු. බිලියන 35ක් පමණ පොහොර සහනාධාරය ලෙස ගෙවා ඇත.

<u>විශේෂ වැඩසටහන්</u>

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) සඳහා බෝග කෘෂිකර්ම අංශය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- වෙළඳ ප්‍රතිපත්තියෙහි කෘෂිකර්ම අංශය සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- මහවැලි කලාපයේ අක්කර 50,000 සෝයා වගාව සම්බන්ධයෙන් වන යෝජනාව සඳහා ආර්ථික සංවර්ධනය සඳහා වන නිලධාරී කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- සහල් වෙළඳ මිල ස්ථාවර කිරීම සඳහා වන නිර්දේශ ඇතුලත් වාර්තාවක් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.

<u>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අවසන් කරන ලද ක්‍රියාකාරකම්</u>

- ව්‍යාපෘති යෝජනා 22ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 17ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් එවන ලද විදේශීය ආධාර යටතේ වන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ වාර්තා 02ක්සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්විම් වලට සහභාගී වීම.

<u>වැවිලි ක්ෂේත්‍රය</u>

වැවිලි ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් තේ, රබර් හා පොල් යන බෝග වලින් සමන්විත වන අතර රටෙහි විදේශීය අපනයන ඉපයීම සඳහා 26%ක දායකත්වයක් ලබා දේ. එයින් 48%ක ආදායමක් තේ අංශය විසින් ලබා දේ. කටු පොල්, සීනි හා කජු යන බෝග ද ආනයන ආදේශන ලෙස දළ ජාතික නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. මිලියන 1.5කට අධික පුද්ගලයින් ප්‍රමාණයක් වැවිලි බෝග නිෂ්පාදන හා සැකසුම් ක්‍රියාවලියේ නිරත වී සිටී. කුඩා පරිමාණ වැවිලිකරුවන් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙන අතර එය නිෂ්පාදනයෙන් 70% ක් පමණ වේ. තේ හා රබර් වගාවන්හි නිෂ්පාදන වැඩි කිරීම, ග්‍රාමීය කෘෂි පාරවල් සංවර්ධනය කිරීම හා කුඩා වතු හිමියන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් කුඩා වතු (තේ, රබර්) හිමියන් සඳහා වූ පුනර්ජීවන ව්‍යාපෘතිය 2016 දී ආරම්භ කරන ලදි.
වැවිලි අංශය සංවර්ධනය කිරීමේ දී වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම ද ඉතා වැදගත් වේ. මෙයින් නිවාස ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. එම නිසා නිවාස 2500ක් පමණ ඉදි කිරීම 2016 වසරේ දී කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාශය විසින් ආරම්භ කර ඇත.

**විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) සඳහා වැවිලි අංශය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.

- ආර්ථික සංවර්ධනය සඳහා වන නිලධාරි කමිටුව වෙත ඉදිරිපත් කිරීමට තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල වන වාර්තාවක් සකස් කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැවිලි අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 29 ඇගයීමට ලක්කර අදාල නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- වැවිලි ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 18ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

## වාරිමාර්ග හා ඉඩම්

ජල සම්පත් සංවර්ධනය යටතේ කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීමට අපේක්ෂා කෙරෙන අතර ඒ යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ගිං / නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතියන් හී ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේදි ද අඛණ්ඩව සිදු කරන ලදී. ඊට අමතරව වාරි අංශයේ පුනරුත්ථාපන ව්‍යාපෘති රැසක් සිදුකරන ලද අතර එමගින් කෘෂිකර්මාන්තය සහ අනෙකුත් ජල අවශ්‍යතා සඳහා අවශ්‍ය ජලය ලබා දීම සුරක්ෂිත කෙරේ.

ඉඩම් අංශය සඳහා 2016 වර්ෂයේ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 7,800 ක් වන අතර ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 4,480 ක් වැය කොට ඇත. රාජ්‍ය ආයෝජන අතර ඉඩම් හිමිකම් ඔප්පු වැඩසටහන (බිම් සවිය), රාජ්‍ය කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, උගත්පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඇතුළු අනෙකුත් සංවර්ධන වැඩසටහන් 2016 වර්ෂයේදී සිදුකොට ඇත.

### සිදුකරන ලද විශේෂ අධ්‍යයන

1. වාරි සහ ඉඩම් අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සහ අවසන් කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල වාර්තාවක් සකස් කර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

2. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය මගින් සකස් කරමින් පවතින උතුරු පළාතේ ජලසම්පත් සංවර්ධන සැලැස්ම සඳහා අවශ්‍ය සහය සහ මඟපෙන්වීම ලබාදීම.

3. ඉඩම් පරිහරණය සඳහා වූ විශේෂිත කණ්ඩායමකින් සැදුම්ලත් කමිටුවක් (Thematic Working Group) යටතේ ශ්‍රී ලංකාවට අදාළ වන පරිදි එක්සත් ජාතීන්ගේ $REDD^+$ ක්‍රමෝපායික වැඩසටහන සකස් කිරීම සඳහා තාක්ෂණික යෙදවුම් සහ අදාළ මගපෙන්වීම් ලබාදීම.

### ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්

1. වාරි හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 09ක් ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.
2. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 35 කට අදාළ නිරීක්ෂණ සකස් කර අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම.
3. දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ වැඩසටහන යටතේ ගංහාද්‍රෝණි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය යොමු කිරීමේ අනුදේශ පිළියෙල කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

4. මොරකහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, වෙලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය, ඉරණමඩු වාරි සංවර්ධන ව්‍යාපෘතිය, දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සහ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන වැනි ප්‍රමුඛ වාරි සංවර්ධන වැඩසටහන් වල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රියව දායකවීම.

   වාරි සහ ඉඩම් අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලෝචන කමිටු සඳහා සක්‍රියව දායක වීම.

## පශුසම්පත් අංශය

ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා විවිධ අංශ හරහා දායකත්වයක් ලබා දෙනු ලබන පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරිගව, කුකුළු, සූකර සහ එළුවන් යන උප අංශ වලින් සමන්විත වේ.
මෙම අංශය වර්තමානයේ සමස්ථ දළ දේශීය නිශ්පාදිතය සඳහා 0.8% දායකත්වයක් ලබා දෙමින් මෙරට තුළ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමටත්, රැකියා උත්පාදනයටත්, ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් හේතු වී ඇත.ගෘහ ඒකක 60,000ක් සෘජුවම මෙම ක්ෂේත්‍රයේ නිරතව සිටින අතර ග්‍රාමීය පවුල් වලින් අසන්න වශයෙන් සියයට 20ක් පමණ සත්ව පාලනය ප්‍රධාන ජීවනෝපාය ලෙස යොදාගනී.

පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් 2020 වන විට කිරි වලින් ස්වයංපෝෂිත වීම හා පශු නිෂ්පාදන ආශ්‍රිත රැකියා සහ ආදායම් ඉහල නැංවීම සිදු කරන අතරතුර දැරිය හැකි මිලකට පශු නිෂ්පාදන වල මිල පවත්වා ගෙන යාම අරමුණු කෙරේ.

2016 වර්ෂයේ පශු සම්පත් අංශය සඳහා සමස්ථ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 2,746 ක් වන අතර එයින් රුපියල් මිලියන 1,800 ක් මූලධන වියදම් ලෙස වෙන්කර ඇති අතර එය ප්‍රධාන වශයෙන් කිරිගවයන් ආනයනය, මිල්කෝ සමාගම සතු කර්මාන්තශාලා නවීකරණය, සත්ව රෝග නිවාරණය, පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇත.

**විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) සඳහා පශු සම්පත් අංශය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත්අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 15ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 06ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

## ධීවරඅංශය

ශ්‍රී ලංකා ආර්ථිකයේ පුළුල් කිරීමට හැකියාවක් ඇති එක් ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස ධීවර අංශය,මෙරට දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.4ක දායකත්වයක් දක්වන අතර එමගින් 560,000ක ජනතාව වෙනුවෙන් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සැලසේ. මිලියන 2.6 ජනතාව සඳහා ජීවනෝපාය සැලසීම, ආදායම් උත්පාදනය, විදේශ විනිමය ඉපයීම සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම මගින් මෙම අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ධීවර අංශය සඳහා 2016 වසරේ සමස්ථ රාජ්‍ය ආයෝජනය රු.මිලියන 6811 වේ. මූලධන වියදම් ලෙස රු.මිලියන 5038 ලබා දී ඇති අතර එය ප්‍රධාන වශයෙන් දිවයින පුරා ධීවර වරාය, නැංගුරම් පලවල් හා ගොඩබෑමේ ස්ථාන සංවර්ධනය, මිරිදිය හා ජලජීවි මත්ස්‍ය නිශ්පාදනය වැඩි දියුණු කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම සඳහා භාවිතා කරන ලදී.

- ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව ධීවර අංශය සඳහා සංවර්ධන වැඩසටහනක් සකස් කිරීමට මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම. 2016 වර්ෂයේදී පෞද්ගලික අංශය ඇතුළු සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් රැස්වීම් 09ක් පවත්වා ඇත.මෙම රැස්වීම මගින් දේශීය හා විදේශිය ආයෝජකයින් සඳහා ආයෝජන අවස්ථා හඳුනාගැනීම හා ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය - පුද්ගලික සහයෝගිතාවයන් ඇති කිරීම සම්බන්ධව කටයුතු කරමින් පවතී.
- ව්‍යාපෘති වාර්තා 35 විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 21ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 සඳහා ධීවර අංශයේ පරිච්ඡේදය සකස් කිරීම.
- ධීවර අංශයේ යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

## 3.3 කර්මාන්තහා වෙළඳ,විදුලි බල හා බලශක්ති

### කර්මාන්ත අංශය

කර්මාන්ත අංශය ප්‍රධාන උප කොටස් තුනකින් එනම් කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර යන අංශ වලින් සමන්විත වේ. ආර්ථික සංවර්ධනයේ හා තිරසාරභාවයේ නියමු ක්ෂේත්‍රයක් ලෙසට කර්මාන්ත ක්ෂේත්‍රය රජය විසින් හඳුනාගෙන ඇති බැවින් කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කිරීම හරහා රටේ සමස්ත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මැදිහත්වීම් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදි.

**2016 වසර තුළදී ඉටු කරන ලද ක්‍රියාකාරකම්**

1. කර්මාන්ත අංශය ආශ්‍රිත ව්‍යාපෘති වාර්තා 30ක් සඳහා නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදි.
2. රේඛීය අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ 25 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදි.
3. සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ආසියානු සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව ආර්ථික සංවර්ධන තීරයක් ඇතිකිරීම (Economic Corridor Development) පිළිබඳව වැඩමුළුවක් පැවැත්වූ අතර ඒ සඳහා වූ අධ්‍යයනය සඳහා තාක්ෂණික සහය ලබා දෙන ලදි.
4. රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පවතින ගැටළු නිරාකරණය සඳහා මැදිහත්වීම.
5. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ කාර්යාංශය ශක්තිමත් කිරීමට ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම.
6. හලාවත ඉරණවිල ප්‍රදේශයේ සංවර්ධන විභවතාවන් හඳුනාගැනීමට අදාළ සම්පත් පැතිකඩ සකස් කිරීම.

<u>**වෙළඳ හා ආයෝජන**</u>

ජාත්‍යන්තර වෙළඳාම හා සෘජු විදේශ ආයෝජන යනු ආර්ථික වර්ධනයේ ප්‍රධාන සාධක දෙකකි. සාපේක්ෂව වාසිදායී ලෙස නිපදවිය හැකි රටවල් වෙත නිෂ්පාදන යොමුකරමින් වඩාත් කාර්යක්ෂම භාණ්ඩ හා සේවා නිෂ්පාදනයකට වෙළඳාම මගින් පහසුකම් සලසයි. සෘජු විදේශ ආයෝජන, තාක්ෂණ හුවමාරුව සඳහා වන වැදගත් වාහකයක් වන අතර මානව ප්‍රාග්ධනය හා ආයතනික වැඩිදියුණුව සඳහාද දායක වේ.
වෙළඳ හා ආයෝජන අංශයට අදාල පහත සඳහන් ක්‍රියාකාරකම් 2016 වසර තුලදී සාර්ථකව නිම කරන ලදී.

1. අමාත්‍ය මණ්ඩල සංදේශ 08කට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
2. පහත දෑ සඳහා නිරීක්ෂණ ලබා දීම.
   - ලෝක බැංකුවේ සංවර්ධන ප්‍රතිපත්ති ණය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ උපායමාර්ග සඳහා
   - ආසියානු සංවර්ධන බැංකුවේ ක්‍රියාකාරී ව්‍යාපාරික සැලැස්ම : 2017-2019 සඳහා

3. පහත දෑ සඳහා සංකල්ප සටහන්/ ප්‍රතිපත්ති සාරාංශ/ නිරික්ෂණ/ ඉදිරිපත් කිරීම් (presentations)/ කථා (speeches) සකස් කිරීම
   - දෙරටේ විදේශ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරී මට්ටමෙන් 2016 ජනවාරි 12 දින පැවැත්වූ ජපාන-ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සංවාදය සඳහා ශ්‍රී ලංකාවේ ඉදිරිපත් කිරීම සැකසීම
   - ගරු අග්‍රාමාත්‍යතුමාට රාජ්‍ය ආයෝජන සැලැස්ම පිළිබඳව සිදුකල ඉදිරිපත් කිරීම
   - AFD වාර්ශික උපදේශක රැස්වීම (Annual Consultation Meeting) 2016 ජූනි 8

- ජපාන-ශ්‍රී ලංකා ආර්ථික ප්‍රතිපත්ති සංවාදය (Sri Lanka-Japan Economic Policy Dialogue) 2016 ජූලි 26.
- ජපානයේ පැවැත්වූ ශ්‍රී ලංකා ආයෝජන සැසිය - 2016 අගෝස්තු 21-24
- සමාජය සඳහා ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සැසිය - 2016 සැප්තැම්බර් 7-10

4. තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) වැඩසටහන හා සම්බන්ධ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකිරීම.
    - ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා එකසත් ජාතීන්ගේ මැදිහත්වීම පිළිබඳ උපදේශාත්මක සැසිය - 2016 ජූලි 4
    - පහත වැඩමුළු සඳහා ඉදිරිපත් කිරීම් හා විස්තර සටහන් පිළියල කිරීම.
        - ආසියානු පැසිපික් කළාපයේ තිරසර සංවර්ධන ඉලක්ක අධීක්ෂණය පිළිබඳ කළාපීය ධාරිතා වර්ධන වැඩමුළුව
        - ඉන්දියාවේ පැවැත්වූ දත්ත හා සංඛ්‍යාලේඛණ උප කළාපීය වැඩමුළුව
        - ජාතික සංවර්ධන වැඩසටහන සඳහා සැලසුම්කරණය හා මූල්‍යකරණය මැයෙන් එක්සත් ජාතීන් විසින් සංවිධානය කරන ලද වැඩමුළුව
    - සංවර්ධනය සඳහා මූල්‍යකරණය වෙනුවෙන් වූ ECOSOC සැසිය සඳහා තාක්ෂණික සහාය ලබා දිම.
    - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ඉදිරිපත් කිරීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්වය පිළිබඳ වාර්තාව සකස් කිරීම.
    - තිරසර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් මූලික අවශ්‍යතාවයක් වූ mapping exercise සම්පූර්ණ කිරීම.

<u>සංචාරක</u>

සංචාරක කර්මාන්තය ආර්ථිකයේ 3 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වේ. දළ දේශීය නිෂ්පාදනයට සංචාරක කර්මාන්තයේ දායකත්වය සියයට 3.5 ක් පමණ වේ. 2016 වසර අවසානයේදී සම්පූර්ණ සංචාරක ආගමනය මිලියන 2 ක් පමණ වේ. සංචාරක කර්මාන්තය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර රජය විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරමින් සුදුසු වාතාවරණය සකස් කර දෙනු ලබයි.

**2016 වසර තුලදී සංචාරක අංශයට සම්බන්ධ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.**

- සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය විසින් යොමුකරන ලද ව්‍යාපෘතියක් නිර්දේශ කර විදේශ අරමුදල් ලබා ගැනීම සඳහා යොමු කරන ලදී.

- අමාත්‍ය මණ්ඩල සංදේශ 08 කට නිරීක්ෂණ සපයන ලදී.

**කම්කරු හා විදේශ රැකියා**

කම්කරු සහ විදේශ රැකියා ප්‍රතිපත්තිය මඟින් ආර්ථික වර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සේවකයින්ගේ අයතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට සහ යහපත් කාර්මික සබඳතාවයන් ඇති කරලීමට අපේක්ෂිතය. ඒ අනුව දැනට පවත්නා නීතිරීති බලාත්මක කිරීමටත් ඉදිරියට මතුවිය හැකි තත්ත්වයන් සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමටත් ඒවා අන්තර්ජාතික යහපත් ක්‍රියාමාර්ග හා සමගාමී කිරීමත් සිදුකළ යුතු වේ. මෙම අවශ්‍යතාවය හඳුනාගෙන 2016 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 14ක් ඇගයීමට ලක් කරන ලදී.
2. අමාත්‍ය මණ්ඩල සංදේශ 15ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
3. පහත දෑ සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
    - ආසියානු සංවර්ධන බැංකුව මඟින් සිදුකරන Country Diagnostic Study සහ Employment Diagnostic Study යන අධ්‍යයනයන් සඳහා
    - කාන්තා ශ්‍රම බලකාය ඉහල නැංවීම පිළිබඳ කමිටුව
    - කාන්තා විගමණික ශ්‍රමිකයන් සඳහා ප්‍රතිපත්ති නිර්දේශ කිරීම වෙනුවෙන් වූ අමාත්‍ය මණ්ඩල කමිටුවේ වාර්තා කෙටුම්පත සඳහා
4. පහත දෑ සඳහා සංකල්ප සටහන්/ ප්‍රතිපත්ති සාරාංශ/ නිරීක්ෂණ/ ඉදිරිපත් කිරීම් (presentations)/ කථා (speeches) සකස් කිරීම.
    - Foresight and Innovation Summit for Sustainable Human Development - 2016 "Visioning Sri Lanka 32030NOW" සමුළුව , 2016 මැයි 24-25
    - Sri Lanka Country Diagnostic සහ Employment Diagnostic Studies යන අධ්‍යයනයන් වෙනුවෙන් වූ උපදේශාත්මක වැඩමුළුව -2016 අගෝස්තු19
5. වැඩමුළු/ සමුළු සංවිධානය කිරීම
    1. "The 2030 Agenda for Sustainable Development: Voice from Asia and Inclusive Growth in Asia" තේමාව යටතේ 2016 මාර්තු 17-18 කොළඹදී පැවැත්වූ හයවැනි ආසියානු සංවර්ධන සැසිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, JICA සහ EDCF ආයතන සමග සංවිධානය කිරීම.

2. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමග සහයෝගයෙන් Foresight and Innovation for Sustainable Human Development 2016 මැයෙන් 2016 මැයි මස කොළඹදී පැවැත්වූ ප්‍රථම ජාතික සමුළුව සංවිධානය කිරීම.

3. ලෝක බැංකුවේ Systematic Country Diagnostic (SCD) වැඩමුළුව සංවිධානය කිරීම.

4. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල(UNFPA) සමග සහයෝගයෙන් 2016 ජූනි මස Improving Employee Contribution for Organizational Growth යන මැයෙන් සහ නොවැම්බර් 26 දින Demographic Dynamics and Productivity Improvementමැයෙන් වැඩමුළු සංවිධානය කිරීම.

6. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල(UNFPA) සඳහා අදාල 2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.

විදුලිබල හා බලශක්ති

විදුලිබල හා බලශක්ති අංශය, නිෂ්පාදන, වාණිජ හා සේවා ඇතුළු ආර්ථිකයේ අනෙකුත් අංශ සමග දැඩි ලෙස බැඳී ඇත. එබැවින් රටේ සංවර්ධනයත් සමග බලශක්ති ඉල්ලුමද ඉහල යමින් පවතී. ශ්‍රී ලංකාවෙහි විදුලි අවශ්‍යතාවය වසරකට සියයට 5 – 7 කින් පමණ ඉහළ ගොස් ඇති අතර අනාගතයෙහි වාර්ෂික විදුලි ඉල්ලුම 4 – 6% කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් සෑම වසරකම මෙගාවොට් 200ක අතිරේක ස්ථාපිත විදුලි ධාරිතාවයක් අවශ්‍ය වන අතර එය පිරිවැය අවම විදුලි ජනන ප්‍රභේද හරහා ලබා ගැනීමට අපේක්ෂිතය.
රටෙහි වර්තමාන ඛනිජතෙල් අවශ්‍යතාවය දිනකට කිලෝබැරල් 100 වන අතර එය වාර්ෂිකව 5% ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වේ. රජය වාර්ෂිකව ඇ.ඩො.මිලියන 5000 – 5500 අතර ප්‍රමාණයක් ඛනිජතෙල් ආනයනය සඳහා වැය කෙරේ. මෙම ඉල්ලුම සපුරාලමින් විදුලිබල හා බලශක්ති අංශයේ වෘද්ධිය උදෙසා ව්‍යාපෘති ගණනාවක් දිවයින පුරා ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

**2016 වසර තුලදී ඉටුකරන ලද කාර්යයන්**

බලශක්ති අංශයේ වර්ධනය සඳහා වූ ව්‍යාපෘති 05ක් නිර්දේශ කරන ලදී.
එයට අමතරව පහත සඳහන් ක්‍රියාකාරකම් නිමකර ඇත.

- අමාත්‍ය මණ්ඩල සංදේශ09ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- බලශක්ති අංශයට අදාල ආධාර පත්‍රිකා/දූත මණ්ඩල (aid memoires/missions) සඳහා නිරීක්ෂණසැපයීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ Green Energy Project ව්‍යාපෘතියට අදාල ණය සාකච්ඡාවට (ADB loan negotiation) සහභාගී වීම.

## 3.4 මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන

**මහා මාර්ග**

වැඩිවන ප්‍රවාහන ඉල්ලුමට නිසි පරිදි ප්‍රතිචාර දැක්වීම රජය මගින් සිදුකළ යුතු අත්‍යාවශ්‍ය කාර්යයකි. මාර්ග ජාලය අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය වන දුම්රිය හා ගුවන් තොටුපල ආදිය හා නිසි පරිදි සංයෝජනය විය යුතුය. ප්‍රදේශ අතර සුමට ලෙස සංචලනයට අවශ්‍ය පහසුකම් සැලසීම මාර්ග ජාලය මගින් ඉටුකරනු ලබන ප්‍රධානම කාර්යයයි. එමෙන්ම, මාර්ග අංශයේ ආයෝජන රටෙහි ආර්ථික වර්ධනය සමග කෙලින්ම සහ සම්බන්ධව ඇත. රටෙහි සෑම ලක්ශ්‍යක්ම එකිනෙක යා කිරීම, වර්ධන මධ්‍යස්ථාන, නැගී එන නගර සහ පළාත් අග නගරයන් අතර නිසි සවලතාව සැපයීම සහ මගී සහ භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැපයීම ආදී අභියෝග රාශියක් මාර්ග අංශයට ඇත. එවැනි පුළුල් පරාසයක ඇති අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ව්‍යපෘති සංකල්ප වැඩි දියුණු කිරීම, ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති ඇගයීම ආදී කාර්යයන් රාශියක් මාර්ග අංශය මගින් ඉටු කරන ලදී.

**ප්‍රවාහන**

කාර්යක්ෂම සහ සන්තතික ප්‍රවාහන සේවාවක් සඳහා වන ඉල්ලුම මගින් ඉහල නැංවූ ආයෝජන අවශ්‍යතා මගින් රටෙහි ප්‍රවාහන කටයුතු සම්බන්ධ යටිතල පහසුකම්වල ක්‍රමික වර්ධනයක් පසුගිය කාලය පුරා සිදුවෙමින් පවතී. දුම්රිය මාර්ග සංවර්ධනය, සංඥා සහ මැදිරි, එන්ජින් වැඩිදියුණුකිරීම, බස්පර්යන්ත සංවර්ධනය, මාධ්‍ය ප්‍රවාහන දියුණුව ආදී දුම්රිය සහ බස් ක්ෂේත්‍රෙය් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ආයෝජන සිදුකරනු ලබා ඇත. මෙවැනි සංවර්ධන උපායමාර්ග මඟින් ප්‍රවාහන අංශය මගීන්ගේඅවශ්‍යතා සඳහා ගැලපෙන, කාර්යක්ෂම සහ තරඟකාරී ක්ෂේත්‍රයක් ලෙස පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, මාර්ග තදබදය සහ ආරක්ෂාව රජයෙහි අනෙකුත් ප්‍රධාන සැලකිල්ලට භාජනවෙන කාරණාවේ.

**වරාය**

වසර කිහිපයකට පෙර යම් පසුබෑමක් තිබූනමුත් කන්ටේනර් මෙහෙයවීම සහ නැව් ආගමනයෙහි ප්‍රගතියක් අත්පත්කර ගැනීමට ශ්‍රීලංකාවේ වරාය හා නාවික අංශයට හැකියාවක් ලැබුණි. 2010 – 2015 කාලය තුල මෙහෙය වූ සම්පූර්ණ කන්ටේනර් ප්‍රමාණය මිලියන 5.1 TEU දක්වා 25ක වර්ධනයක් ඇතිවූ අතර නැව් ආගමනය ක්‍රමිකව සියයට 17ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

## ගුවන් සේවා

ගුවන් මගින් 2015 වසර තුල මිලියන 8.5ක මගින් සහ මෙත්රික් මෙට්‍රික් ටොන් 215,032ක භාණ්ඩ ප්‍රමාණයක් ආරක්ෂාකාරීව ප්‍රවාහනය කර ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ගුවන්මගීන්, ගුවන්භාණ්ඩ හා ගුවන්යානා හැසිරවීම සම්බන්ධයෙන් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. ගුවන්තොටුපල 2015 වර්ෂයේදී ගුවන්මගීන් මිලියන 8.5 හසුරුවා ඇති අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 09ක වර්ධනයකි. ලොවපුර ව්‍යාප්ත වූ ශක්තිමත් ගුවන්ජාලයක් මගින් ලංකාව ලෝකයේ වඩාත් ජනප්‍රිය සංචාරක මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා හොඳම ගුවන්සේවා සපයන්නා වීම ගුවන්ක්ෂේත්‍රයේ ප්‍රධානතම ප්‍රතිපත්ති අංගයක් වේ.

**විශේෂිත වූ කාර්යයන්**

1. රේඛීය අමාත්‍යාංශය මඟින් යොමු කළ ඉහත විෂයන් වලට අදාල ව්‍යාපෘති යෝජනා සහ වැඩසටහන් 29 ක් ඇගයීම.

2. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශයන්ට අදාළ ආංශික ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.

3. මහාමාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශ වලට ප්‍රතිපත්ති හා සංවර්ධන උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.

4. මහාමාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය ක්ෂේත්‍රවලට අදාලව රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා පරිච්ඡේද සකස් කිරීම.

5. විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් 10 කට පමණ අදහස් දැක්වීම.

6. 2017 - 2020 සඳහා රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.

7. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන ක්ෂේත්‍ර වල පවතින කාලීන ගැටලු අධ්‍යනය කිරීම.

8. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන ක්ෂේත්‍ර සඳහා යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 32 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.

9. ප්‍රගති සමාලෝචන කමිටු, මෙහෙයුම් කමිටු හා විදේශණය නියෝජිතායතන සමඟ වන රැස්වීම් 35 කට පමණ සහභාගී වීම.

## 3.5 නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර

<u>නිවාස සහඉදිකිරීම් අංශය</u>

මෙම අංශය නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය හා සම්බන්ධව කටයුතු කරනු ලබයි.
නිවාස හා ඉදිකිරීම් අංශය සඳහා 2016 වසර තුල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇති අතර ව්‍යාපෘති යෝජනා 23 ක් ඇගයීමට ලක්කර ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- නිවාස සහ නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් අනාගත සංවර්ධන ක්‍රමෝපායන් සහ වැඩපිළිවෙලවල් ඇතුලත් කරමින් සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- රටේ දුප්පත් ජනතාවගේ ස්ථිර නිවාස අවශ්‍යතාවය සපුරාලීම අරමුණු කරගනිමින් "සැමට සෙවන' නිවාස වැඩසටහන දියත් කිරීමට දායකත්වය සැපයීම.
- නිවාස සහ නාගරික සංවර්ධන අංශ දෙකෙහි ඉදිරියෙදී ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනාවී ඇති ව්‍යපෘති සඳහා ව්‍යපෘති පෙළගැස්ම සකස් කිරීම.
- නිවාස සහ ඉදිකිරීම් අංශය නගාසිටුවීම සඳහා ඉදිරි වසර කිහිපය තුල රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති, අදාල අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන සමග සමගාමීව ප්‍රමුඛතාගතකොට " මහජන ආයෝජන සැලැස්ම 2017-2020" සකස් කිරීම.
- දේශීය ඉදිකිරීම් අංශය ඉහලනංවාලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිලිබඳ සාකච්ඡා කිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන සමග සාකච්ඡා මාලාවක් දියත් කිරීම.

<u>ජල සම්පාදනයහා සනිපාරක්ෂාව :-</u>

රජය විසින් ආංශික වශයෙන් ලභා කර ගැනීමට අපේක්ෂිත අවසාන ඉලක්කය වන්නේ 2020 වන විට රටේ සියලුම ජනතාවට අවශ්‍ය ආරක්ෂිත පානිය ජලය ලබා දීමත්, එයින් සියයට 60 කට පමණ පානීය නළ ජලය ලබා දීමත් සහ රටේ නාගරිකව වෙසෙන ජනගහනයෙන් සියයට 7 කට පමණ අපජල පහසුකම් ලබාදීමත්ය. රටේ සියලුම ජනතාවට අවශ්‍ය ආරක්ෂිත පානිය ජල හා සනිපාරක්ෂක පහසුකම් වෙත සාධාරණ ප්‍රවේශයක් ඇති කිරිමේ වැදගත්කම හඳුනා ගනිමින්, මෙම පහසුකම්හි ප්‍රාදේශිය වශයෙන් ඇති විෂමතාවයන් අවම කිරිම සඳහා රජය විසින් මධ්‍ය කාලීනව අවධානය යොමු කරනු ලැබේ.

ඒ අනුව මෙම අංශයේ ආයෝජන ප්‍රමුඛතාවයන් ප්‍රධාන වශයෙන් හඳුනා ගනු ලබන්නේ ආංශිය වශයෙන් පවත්නා ගැටළු හා අපහසුතාද, තිරසාර සංවර්ධන අරමුණු 6 යටතේ හඳුනාගෙන ඇති සැමට දැරිය හැකි මුදලකට ආරක්ෂිත පානීය ජල හා සනීපාරක්ෂණ පහසුකම් ඇති සාධාරණ පරිසරයක් 2030 වන විට ගොඩනැගීම යන ඉලක්කයන්ද සලකා බැලීමෙනි.

ඒ අනුව මෙම අංශයේ මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන, ප්‍රධාන වශයෙන් යොමු වනු ලබන්නේ ප්‍රාදේශිය වශයෙන් ජල සැපයුම් පහසුකම්වල පවතින විෂමතාවයන් අවම කිරිමත්, හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝග වැනි ජලාශ්‍රිත ලෙඩ රෝග ව්‍යාප්තව පවතින ප්‍රදේශවලට ප්‍රමුඛතාවය දෙමින් එම ප්‍රදේශවලට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයිමටත්ය. ඒ සමඟම අඩු ජන ඝනත්වයක් සහිත ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා ග්‍රාමීය ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති ධෛර්යමත් කරනු ලැබේ.

## වර්ෂය තුළ කරන ලද ආංශික කාර්යයන්:

- නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 15ක මූලික අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. ඒවා සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ අදාල රේඛිය අමාත්‍යාංශ වෙතද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව සකස් කරන ලද නිර්දේශ වර්තා අදාල පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී.
- නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02 කට අදාල නිරීක්ෂණ ලබා දීම.
- ජලසම්පාදන හා සනීපාරක්ෂක අංශයේ රාජ්‍ය ආයෝජන වැඩසටහන (2018 – 2020) සකස් කිරීම.
- විදේශීය ණය නියෝජිතායතන විසින් ඉදිරිපත් කරන ලද විදේශිය ණය ගිවිසුම් සම්බන්ධයෙන් වන සටහන් 04 කට (Aide Memoires) පමණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ලබා දීම.
- ප්‍රගති සමාලෝචන කමිටු, මෙහෙයුම් කමිටු හා විදේශ ණය නියෝජිතායතන සමඟ පවත්වන රැස්වීම් ආදී රැස්වීම් 20 කට පමණ සහභාගී වීම.
- ආංශික සංවර්ධන ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළුකාරී තත්ත්වයන් සාකච්ඡා කිරීමට අවශ්‍ය පරිදි රැස්වීම් සංවිධානය කිරීම හා ඊට අදාළ පසු ක්‍රියාමාර්ග ගැනීම.
- ආංශීය ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තු සකස් කිරීම.

<u>පරිසරකළමනාකරණය</u>

නියමිත ආයෝජනයන් සිදුකරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට පහසුකම් සපසන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

දිනෙන් දින වර්ධනය වන ජනගහනයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර, ජලය, බලශක්තිය , ඉඩම්, හා අනෙකුත් ස්වාභාවික සම්පත් සඳහා වන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් හරිත, පිරිසිදු සහ අනුහුරු සංවර්ධනයක් ළඟා කර ගැනීමේ ගෝලීය අපේක්ෂාව බරපතල අභියෝගයකට ලක්ව තිබේ. පරිසර විනාශයේ ප්‍රතිඵලයක් මෙන්ම ඊට හේතුකාරකයක් ද වන දේශගුණික විපර්යාස තවත් විශේෂිත අභියෝග රැසක් මතු කරයි. ශීඝ්‍ර දේශගුණ විපර්යාසයන්ගේ බලපෑම් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ අවස්ථාව දුර්වල කරන අතරම දිළිඳුකම පිටු දැකීම සඳහා ඇති සම්පත් මෙන්ම කාල පරාසයද සීමා කරයි. එබැවින් පිරිසිදු, වඩා කාර්යක්ෂම සහ සාධාරණ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා වූ සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය මතුව තිබේ. මේ අනුව සංවර්ධන ආර්ථිකයන්හි ඉතා වැදගත් අංශයක් ලෙස පරිසරය සැලකිය හැකි අතර එය නවීන ආර්ථික විද්‍යාවෙහි අලුතින් මතු වී එන අංගයක් වේ.

පරිසර කළමනාකරණයේ විෂය පථයට පරිසර දූෂණය පාලනය කිරීම, කසළ කළමනාකරණය, වනාන්තර සංරක්ෂණය, තිරසාර ඉඩම් කළමනාකරණය, මිනිස් - වනජීවී සහ පැවැත්ම, ජීවී සම්පත් සංරක්ෂණය සහ ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය ආදිය අතුළත් වේ.

අවම කාබන් පරිභරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛවවිවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ සුවාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංහයේ අවධානය යොමු වී ඇත. තරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවක්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වන ජෛවවිවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

පරිසර කළමනාකරණඅංශය ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන ඉලක්ක කිහිපයක් පහත පරිදි වේ.

- 2018 වන විට කසල වලින් තොර, විධිමත් කසල කළමනාකරණයක් සහිත රටක් බිහි කිරීම.
- 2018 වන විට දිවයින වටා පිහිටි සමුදුර දූෂණයෙන් තොර කලාපයක් බවට පත් කිරීම.
- 2018 වන විට වන ගහනය 29% සිට 32% දක්වා හෙක්ටයාර 60,000 කින් ඉහළ නැංවීම.
- 2018 වන විට, වසරකට පාරිසරික සංචාරකයින් 800,000ක් ආකර්ශණය කර ගැනීම සහ රු. මිලියන 2,500ක ආදායමක් ඉපයීම
- 2025 වන විට අලි-මිනිස් ගැටුම මුලිනුපුටා දැමීම සඳහා ජෛව වැටවල් ද සමඟ කි. මී. 3,050ක දිගින් යුතු විදුලි වැටවල් ඉදි කිරීම

- 2020 වන විට, මෙරටට ආනයනය කරනු ලබන විද්‍යුතයෙන් පමණක් ක්‍රියා කරන වාහන ප්‍රමාණයේ ප්‍රතිශතය 25%ක් දක්වා ඉහළ නැංවීම.

- 2020 වන විට ජාතික විදුලි සැපයුම් ජාලයට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලබා දෙනු ලබන දායකත්වය 20%ක් දක්වා ඉහළ නැංවීම.

- 2005-2015 ට සාපේක්ෂව 2030 වන විට ආපදා හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු කිරීම.

- 2018 වන විට කාලගුණ වාර්තාවන්ගේ නිරවද්‍යතාවය 70% සිට 72% දක්වා ඉහළ නැංවීම.

- 2018 වන විට නාය යෑම් හේතුවෙන් සිදු වන ජීවිත හානි වැළැක්වීම.

- 2018 වන විට ගංවතුර තත්ත්වයන්ගේ බලපෑමට ලක්වන ජන සංඛ්‍යාව 50%කින් පහළ දැමීම.

**විශේෂ අවස්ථා**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 38 ක්ඇගයීමට ලක් කිරීම.

- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 23 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

- 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළියෙල කිරීම.

- තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්ට අදාළ ඉලක්ක සඳහා ශ්‍රී ලංකාවට අනුරූප දර්ශක ඇතුළත් කිරීම.

- බස්නාහිර පළාතේ ගොඩනැගිලි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කිරීමට අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම.

- ගංගාවලින් ලබා ගන්නා වැලි සඳහා ආදේශකයන් ලෙස මුහුදු වැලි සහ නිෂ්පාදිත වැලි භාවිතය දිරිමත් කිරීමේ යෝජනාවක් සකස්කිරීම හා එය 2017 අයවැය සඳහා අයවැය යෝජනාවක් ලෙස ඇතුළත් කිරීම.

- පරිසර කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.

## 3.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික

<u>සෞඛ්‍ය</u>

රටකට ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා නිරෝගී ජාතියක් පැවතීම වැදගත් වේ. එහෙයින් ජාතික සෞඛ්‍ය සේවය සඳහා ඉහළ ආයෝජනයක් කිරීම, අවශ්‍ය ආයතනික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කිරීම තුලින් නිරෝගී ජාතියක් ගොඩ නැගීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ සඳහා 2016 වසර තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණි.

1. ව්‍යාපෘති යෝජනා 80 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දී ඇති අතර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන වෙත යොමු කර ඇත.
2. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සඳහා නිරීක්ෂණ ලබා දී ඇත.
3. සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (Health Sector Development project) සැකසීම සඳහා අවශ්‍ය නිර්දේශ හා යෝජනා ලබා දී තිබේ.
4. ඉහල ආයෝජනයක් සහිත විදේශ මූල්‍ය පහසුකම් ලබා ගැනිම සඳහා යොමු කර ඇති සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දී ඇති අතර ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය වැනි විදේශ මූල්‍ය ආයතනසමඟ ඒ සම්බන්ධයෙන් රැස්වීම් පවත්වා ඇත.
5. සෞඛ්‍ය සේවා සැපයීම සම්බන්ධ සුදුසු මුල්‍ය උපාය මාර්ගයක් හඳුනා ගැනීම, ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, තෘතීයික සෞඛ්‍ය සේවා ආයතන සඳහා වන ප්‍රධාන සංවර්ධන සැලැස්ම සකස් කිරීම වැනි කටයුතු සඳහා තාක්ෂණ සහයෝගය ලබා දීම.

<u>ක්‍රීඩා අංශය</u>

මෙරට සෑම පුරවැසියකුම ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම හරහා සෞඛ්‍ය ජාතියක් ගොඩනැගීම රජයේ ඉලක්කය වේ.බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ලබා දීමට වැයවන වියදම අඩු කිරීමත්. නීරෝගී ජාතියක් බිහි කිරීමත් මෙහි අරමුණ වන අතර ඒ තුළින් ආර්ථිකය දියුණු කිරීමට මානව හා මූල්‍ය සම්පාදනය වැඩි වැඩියෙන් යෙදවීමට හැකි වන අතර ක්‍රීඩාව සමාජය හා සංස්කෘතිය සමඟ බැඳුනු අංගයක් වනු ඇත. මෙම සංකල්පය සමාජ ගත කිරීමේ අරමුණින්, 2016 වසරේ සිට රජය විසින් ක්‍රීඩා හා ශාරීරික සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ සතිය යනුවෙන් සතියක්ද නම් කරනු ලැබේ. ( 2016 ජනවාරි 25 සිට 2016 ජනවාරි 30 දක්වා) මීට අමතරව සෑම පාසැල් සිසුවකුට ක්‍රීඩාවක යෙදීම අනිවාර්ය කිරීමේ රජයේ අරමුණ ප්‍රකාශයට පත් කළ අතර , පාසැල් ළමුන්ගේ විශේෂ ක්‍රීඩා දක්ෂතා මුල් වයස් කාණ්ඩ වලදී හඳුනාගෙන, ඒවා දියුණු කිරීමේ වැඩසටහන්ද සම්පාදනය කරනු ලැබිණි. 2016 වසර තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරඟ වලදී සැලකිය යුතු පදක්කම් සංඛ්‍යාවක් දිනා ගැනීමට සමත් විය.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින්ද සැළකිය යුතු ආයෝජනයක් සිදු කරනු ලැබිණි. ක්‍රීඩා අංශය සම්බන්ධයෙන් පහත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණි.

* ව්‍යාපෘති වර්තා 10ක් ඇගයීමට භාජනය කර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා අයවැය දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීම.
* ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍යමණ්ඩල සංදේශ 05ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.
* ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සම්බන්ධයෙන් පැනනැගුනු ගැටළු විසඳීම සඳහා එම අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන නියෝජනය කරන නිළධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම.
* 2017 – 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ක්‍රීඩා අංශය සම්බන්ධ පරිච්ඡේදයක් සම්පාදනය කරන ලද අතර, ඒ සඳහා වැඩමුළු හා සාකච්ඡා අදාළ ආයතන සමඟ සිදු කරනු ලැබිණි.
* ක්‍රීඩා සතිය වෙනුවෙන් සෞඛ්‍ය සම්පන්න දිවිපැවැත්මක් සඳහා ශාරීරික ක්‍රියාකාරකම් වල වැදගත්කම නමින් 2016 ජනවාරි 25 වන දින දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට දේශනයක් පැවැත්වීම.

<u>ආගමික, සංස්කෘතික සහ උරුමයන්, ජාතික සහජීවනය, සංවාද සහ රාජ්‍ය භාෂා අංශය</u>

මෙම අංශය අමාත්‍යාංශ හතකින් සමන්විත වේ. එනම්, බුද්ධ ශාසන අමාත්‍යාංශය, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය වශයෙනි. මෙම අමාත්‍යාංශ හත මගින් බුද්ධශාසන, හින්දු, ක්‍රිස්ත්‍රියානි සහ මුස්ලිම් යන ආගම් ද සංස්කෘතිය හා උරුමයන්, ජාතික ලේඛණාරක්ෂාව, ජාතික කෞතුකාගාරය, රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතාවය යන කේෂ්ත්‍රයන් ආවරණය කරනු ලැබේ.

විශේෂ සිදුවීම්

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා තුනකට පිලිතුරු සැපයීම.
- 2016 වර්ෂය සඳහා ලැබුණු ව්‍යාපෘති වාර්තා 46 කට පිළිතුරු සැපයීම.
- ජාතික සංහිදියාව, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ පවත්වන ලද උපදේශන කමිටු සඳහා සහභාගි වීම.
- ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය මගින් පවත්වන ලද සංහිදියාව සඳහා කලාව යන ජාත්‍යන්තර සමුළුවට සහභාගි වීම.

## 3.7 අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරුතාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ

<u>අධ්‍යාපනඅංශය</u>

වසර 13 ක අනිවාර්යය අධ්‍යාපනය, පාසැල් අධීක්ෂණ මණ්ඩල ස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරීක්ෂක ආයතනය ස්ථාපනය කිරීම වැනි ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට අවශ්‍ය අඩිතාලම 2016 වසරේදී සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය ඇතුළුව පාසැල් පද්ධතියේ සිදු කළ යුතු වන වෙනස් කම් සිදු කිරීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ.

තවද, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, පන්ති කාමර, විද්‍යාගාර සහ විද්‍යාගාර උපකරණ වැනි අවශ්‍ය මූලික පහසුකම් පාසැල්වල ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණ.

**2016 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග සහ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP), දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය (TSEP) යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම තවදුරටත් පුළුල් කිරීම සඳහා වන "ජාතික ඉගෙනුම් පද්ධතිය ද ඇතුළුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පරිපූර්ණ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායක් ස්ථාපනය කිරීම සඳහා පළාත් හා කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීම" ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩමුළු හා රැස්වීම්වලට සහභාගී වීම.

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 සඳහා අධ්‍යාපන අංශය පිළිබඳ පරිච්ඡේදය සකස් කිරීම

- අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 16 ක් ඇගයීම.

<u>උසස් අධ්‍යාපන</u>

2016 වර්ෂය තුළ, උසස් අධ්‍යාපන අංශය තවදුරටත් වර්ධනය වූ අතර, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන අතරම, විශේෂයෙන්ම අ.පො.ස (උසස්/පෙළ) තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන ලද සිසුන් සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා දීම සඳහා තාක්ෂණවේද පීඨ ඇතුළු නව අධ්‍යයන පීඨ ආරම්භ කරන ලදී. එමෙන්ම, නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පවතින අධ්‍යයන පාඨමාලා නවීකරණය කිරීම මඟින් නිසි රැකියා අවස්ථා ලබා ගත හැකි උපාධිධාරීන් බිහිකිරීම පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ. ඊට අමතරව, කර්මාන්ත අංශය සමඟ සබඳතා ගොඩනගාගැනීම සඳහා විශ්වවිද්‍යාල රැසක් විසින් පියවර ගන්නා ලද අතර, විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපනය කරන ලදී.

රටේ ශිෂ්‍ය ප්‍රජාවට පවතින උසස් අධ්‍යාපන අවස්ථා නංවාලීමේ අරමුණින්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීමට ද, ඒවා තවදුරටත් පුළුල් කිරීමට ද පියවර රැසක් ගන්නා ලදී.

2016 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හරහා අධ්‍යාපනවේදී උපාධි ලබා දීම මඟින් ගුරුවරුන් 5,000 ක් පුහුණු කිරීමේ යෝජනා ක්‍රමය සහ රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වන සිසුන් සඳහා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමයපිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)සකස් කිරීම පිළිබඳ මූලික සාකච්ඡාවලට සහභාගී වීම.
- උසස්අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ ඒ පිළිබඳව මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 සඳහා උසස් අධ්‍යාපන අංශය පිළිබඳ පරිච්ඡේදය සකස් කිරීම.
- උසස් අධ්‍යාපන හා මහාමාර්ගඅමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- උසස් අධ්‍යාපන හා මහාමාර්ගඅමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 1 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 75ක් ඇගයීම.

## නිපුණතා අධ්‍යාපන අංශය

රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රමබලකායක්සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සහිත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම අරමුණු කර ඇත. මෙහිදී හැකියාවන්, මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීමත් වෘත්තීය පුහුණු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගුණාත්මක වෘත්තීය පුහුණුවකට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමත් තුලින් ගෝලීය ආර්ථිකය තුළ සේවා නියුක්ත විය හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම මූලික ප්‍රතිපත්තිය වේ.

### 2016 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- ව්‍යාපෘති වාර්තා 25ක් ඇගයීමට ලැබුණු අතර ඉන් 23ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ. ඉතිරි ව්‍යාපෘති වාර්තා සඳහා පැහැදිලි කිරීම් සහ වෙනස්කිරීම් ඉදිරිපත් කරන ලෙස අදාල ආයතන වෙත දැනුම් දී ඇත. ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

- ව්‍යාපෘති සැකසීමට අදාල ගැටළු හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන විට අන්තර් ගත කල යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා දැනුවත් කිරීම.

- තවද, වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධවත් එහිදී පාසැල් හැරයන්නන් වෘත්තීය පුහුණු අංශය කරා යොමු කරවා ගැනීම සම්බන්ධවත් වැඩි පුමුඛතාවයක් ලබා දෙන ලද අතර වෘත්තීය පුහුණ අධ්‍යාපනයේ ගුණත්වය හා අදාලත්වය ඉහළ නැංවීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්ම යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ ඉදිරි සැලසුම් හා ආයෝජන ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම හා ලැයිස්තුගත කිරීම.

- නිපණතා ආංශීය සංවර්ධන වැඩසටහනට අදාලව අන්තර් අමාත්‍යාංශ කමිටු රැස්වීම පැවැත්වීම හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ගැටළු විසඳීම

## තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 76 ක් ඇගයීමට ලක්කර ඇත.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 02 කට නිරීක්ෂණ සපයා ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ක්ෂේත්‍ර සටහන් සැකසීම.
- තොරතුරු තාක්ෂණ අංශයට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම.

**<u>විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ</u>**

වේගයෙන් වර්ධනයවන තරඟකාරී ලෝක ආර්ථිකය තුළ, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය ජාතික සංවර්ධනයේදී උපායමාර්ගික වශයෙන් ඉතා වැදගත්ය. රටක ජාතික ධනය ඉපැයීමට අවස්ථාව සැලසීම සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයේ සීඝ්‍ර ප්‍රගතිය හා පැතිරුණු බැවින් ප්‍රයෝජන ගැනීමට එහි ධාරිතාව, ඉහළ නැංවීම සඳහා ලෝක ආර්ථිකය තුළ විශේෂ බලපෑමක් ඇති කර තිබේ. ප්‍රචාරණය හා අභිවර්ධනය තීව්‍ර කිරීම තුළින් සහ භාවිතය තුළින් ධාරිතා සංවර්ධනය හා පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ සම්බන්ධ රජයේ ප්‍රතිපත්තියයි. සංවර්ධන හා පර්යේෂණ ක්ෂේත්‍ර 4ක් තුළින් සංවර්ධනය කෙරේ. නැනෝ තාක්ෂණය, ජෛව තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික හා අභ්‍යාවකාශ තාක්ෂණය එම ක්ෂේත්‍රයන්ය. රජය එම අංශයන්හි සිදු කරන විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන කටයුතු කෙරෙහි ඇති අවධානම අවම කිරීමට විවිධ පියවරයන් ගෙන ඇත.
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අංශය මගින් 2016 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

**නිමකළ කාර්යයන්**

- ව්‍යාපෘති 11 ක් ඇගයීම් කර ඇති අතර ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය සකස් කර ඇත.
- අදාළ නිර්දේශයන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

- විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 17ක් සඳහා නිරීක්ෂණ ලබා දී ඇත.
- රාජ්‍ය ආයෝජන සැලැස්ම 2017-2020 සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අංශයට අදාළ සටහන් සකස් කිරීම, ආයෝජන ලේඛනය සකස්කිරීම හා අදාළ වැඩමුළු පැවැත්වීම.
- විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මඟින් පවත්වන ලද වැඩමුළු සඳහා සක්‍රීයව සහභාගීවීම.
- විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිවලට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා අමාත්‍යාංශය හා අදාළ ආයතන සමඟ රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම.

## 3.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ අංශය

### සමාජ ආරක්ෂණ අංශය

සමාජ ආරක්ෂණ අංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ , පුනුරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාව දිළිඳුකම දුරලීමේ ක්‍රියාවලියේදී සුවිශේෂි ප්‍රගතියක් අත්කරගෙන ඇත. එසේ වුවද, සම්පත් බෙදීමේ අසමානතාවය හා අවධානමට පහසුවෙන් ලක්වීමේ හැකියාව ආදී ගැටළු තවමත් දක්නට ලැබේ. ජනගහනයේ ඇතැම් කොටස් : එනම් ළමුන්, වරප්‍රසාද නොලත් කාන්තාවන් , වැඩිහිටියන් හා අබාධිත පුද්ගලයන් පහසුවෙන් අවධානමට ලක් වීමේ හැකියාවක් ඇත. මේ හේතුව නිසා අවදානමට ලක් වූ ජනගහනය ඉලක්ක වූ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන්ගේ සුභසාධනය ඇතිකිරීම කෙරෙහි රජයේ විශේෂ අවධනය යොමු වී ඇත. ඒ අනුව අවදානමට ලක් වූ ජනගහනය ඉලක්ක කර ගනිමින් ප්‍රධාන සුභ සාධන හා ජීවන තත්වයන් ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු වන අතර, එමඟින් සමස්ත සංවර්ධනයේ ප්‍රතිලාභ රටේ සෑම දෙනාටම භුක්ති විඳීමට හැකිවනු ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

* අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 20 කට හා ව්‍යාපෘති යෝජනා 24 ක් සඳහා අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
* අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මෙහෙය වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
* මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අදාළ අංශයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
* නිශ්චිත කාල පරිච්ඡේද සඳහා රජය මඟින් ආයෝජනය කළ හැකි සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීම සහ එම සම්පත් විවිධ අංශ, උප අංශ සහ රජයේ ආයතන අතර කුමන ආකාරයකින් වෙන් කරන්නේද යන්න පෙන්වා දීම අරමුණු කරගත් ‘‘රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 ’’ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.

## ප්‍රාදේශීය සංවර්ධනය

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මඟින් අවධාරණය කෙරේ. ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරිමේදී පළාත් 9 තුළ පවතින මූලික සංවර්ධන ගැටළු, විෂමතාවන් හා අභියෝගයන් පිළිබඳව අනාවරණය වේ. ඒවා අතුරින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් කෙරෙහි අවධානය යොමු කිරිම ඉතා වැදගත්වන අතර එය අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය, මානව සංවර්ධන දර්ශකය, කාර්මීකරණ මට්ටම, කෘෂිකාර්මික හා යටිතල පහසුකම් සංවර්ධන මට්ටම යන කාරණා සමඟ සමීපව බැඳී පවතී. ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන්හී අවධානය යොමු වී ඇත.

කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරිම, ගම් උදාව වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම, ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරිම, ගම නැගුම හා පුරනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශිය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයකි. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

**මැදි කාලීන ඉලක්ක:**

- වසර 2020 වනවිට නැගෙනහිර හා ඌව පළාත් වල පවත්නා දුගීකම ජාතික මට්ටමේ අගය දක්ත අවම කිරීම.
- වසර 2020 වනවිට වෘත්තීය පුහුණු හා තාක්ෂණික අධ්‍යාපනය සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව දැනට පවතින මට්ටමට වඩා 50% න් ඉහළ නැංවීම.
- මධ්‍යම පළාත, උතුරු හා උතුරු මැද පළාත්වල පවතින මාතෘ මරණ අනුපාතිකය වසර 2020 වනවිට ජාතික අගය දක්වා අවම කිරීම.
- මධ්‍යම, උතුරු හා වයඹ පළාත්වල පවතින ළදරු මරණ අනුපාතිකය වසර 2020 වනවිට ජාතික මට්ටම දක්වා අවම කිරිම.
- වසර 2020 වනවිට නාගරික අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 100,000 ක් ඉදිකිරීම.
- වතු ප්‍රජාව සඳහා මූලික පහසුකම් සහිත නිවාස ඒකක 65% ක් 2020 වනවිට ලබා දීම.

- පූර්ණ කාලීන නව ව්‍යවසායකයන් 150,000 ක් සියළුම පළාත් ආවරණය වනපරිදි ඇති කිරීම හා ස්වයං රැකියා තුළින් පවුල් 350,000 කට අමතර ආදායම් උත්පාදන ක්‍රමෝපායන් ඇති කිරීම.

- ප්‍රමුඛතාවයන් පදනම් කරගෙන 50% කට වැඩි කුඩා හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග ක්‍රම පුනරුත්ථාපනය කිරීම.

**විශේෂ අවස්ථා**

- අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- අදාළ රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 13 ක් ඇගයීමට ලක් කිරීම.

  රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා “ප්‍රාදේශීය සංවර්ධනය” පිළිබඳ පරිච්ඡේදය සකස් කර සම්පූර්ණ කිරීම

- මැදි හා දිගුකාලීන ඉලක්ක ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබාදීම.

## 3.9 රාජ්‍ය කළමනාකරණයහා පාලන

<u>රාජ්‍ය කළමනාකරණය</u>

රාජ්‍ය කලමනාකරණයේ ප්‍රධාන උපායමාර්ගය වනුයේ කාර්යක්ෂම හා මහජන හිතවාදී සේවාවක් සැපයීමට හැකි වනු පිණිස නවීන තාක්ෂණික ක්‍රම භාවිතය හා රාජ්‍ය සේවයේ ඵලදායීතාවය ඉහල නැංවීම තුලින් කළමනාකරණ ක්‍රමවේද හා පරිපාලන ක්‍රම වෙනස් කිරීමවේ.

කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍යසේවාවක් සැපයීම සඳහා රාජ්‍ය සේවය තුළආයතනික, මානව සහ සේවා සැපයීමේ ඵලදායිත්වය යන අංශයන්හි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ.පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගෙන රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරනු ලබයි. මේ නිසා ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ. මෙම දෙපාර්තමේන්තුවේරාජ්‍ය කළමනකරණ අංශය ප්‍රධාන වශයෙන් ක්ශේස්ත්‍ර 5ක් ආවරණය කරනු ලබයි: රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය සහ විදේශ කටයුතු සහ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ පාර්ලිමේන්තුව ඇතුලු රාජ්‍ය කලමනාකරණ අංශය යටතට ගැනෙන විශේෂ වියදම් ශීර්ෂඉහත අංශ ආවරණය කරමින් පසුගිය වසර තුළ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 60 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර නිර්දේශ කිරිමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.
- රාජ්‍ය කළමනාකරණ අංශයට අයත් විවිධ අමාත්‍යාංශ වලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 22 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදි.
- අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මෙහෙය වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා එම ආයතන වල වර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- රාජ්‍ය පාලන අංශය සඳහා රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.

## 3.10 විමධ්‍යගත අයවැය

**විමධ්‍යගත අයවැය වැඩසටහන**

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සියළු ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන්ගේ සහ දිස්ත්‍රික් 10ක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් සඳහා ප්‍රතිපාදන කළමනාකරණය සම්බන්ධයෙන් 2016 වසරේදී තාක්ෂණික සහය ලබාදෙන ලදී. ප්‍රාදේශිය සංවර්ධනය අරමුණු කරගෙන යටිතල පහසුකම්, අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය, රැකියා උත්පාදනය, වෘත්තිය පුහුණු ආදී ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා දිස්ත්‍රික් 10ක් නියෝජය කරනු ලබන දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 74 දෙනෙක් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු 29 දෙනෙක් සඳහා වු ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය. මේ සඳහා දිස්ත්‍රික් 10ක් නියෝජනය කරනු ලබන දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සඳහා රු. මි. 1,110ක් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් සඳහා රු. මි. 435ක් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය මඟින් වෙන් කර ඇත. 2016 දෙසැම්බර් 31 වන දිනට මෙම වැඩසටහන 100%ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

**2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් 10ක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මූලධන අයවැය ප්‍රතිපාදනවල ප්‍රගතිය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | යෝජනා ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරු සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | මුළු වෙන් කිරීම (රු.) | අනුමත කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම (රු) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | රත්නපුර | 11 | 11 | 100% | 165,000,000 | 165,000,000 | 100% |
| 2 | පොළොන්නරුව | 5 | 5 | 100% | 75,000,000 | 75,000,000 | 100% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | බදුල්ල | 8 | 8 | 100% | 120,000,000 | 120,000,000 | 100% |
| 4 | අනුරාධපුර | 9 | 9 | 100% | 135,000,000 | 135,000,000 | 100% |
| 5 | මාතලේ | 5 | 5 | 100% | 75,000,000 | 75,000,000 | 100% |
| 6 | නුවර | 12 | 12 | 100% | 180,000,000 | 179,973,000 | 100% |
| 7 | ත්‍රිකුණාමලය | 4 | 4 | 100% | 60,000,000 | 60,000,000 | 100% |
| 8 | මඩකලපුව | 5 | 5 | 100% | 75,000,000 | 75,000,000 | 100% |
| 9 | අම්පාර | 7 | 7 | 100% | 105,000,000 | 105,000,000 | 100% |
| 10 | නුවරඑළිය | 8 | 8 | 100% | 120,000,000 | 120,000,000 | 100% |
| එකතුව | | 74 | 74 | 100% | 1,110,000,000 | 1,109,973,000 | 100% |

**2016 දෙසැම්බර් 31 දිනට ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මූලධන අයවැය ප්‍රතිපාදනවල ප්‍රගතිය**

| අනු අංකය | ගරු ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී | මුළු වෙන් කිරීම (රු.) | අනුමත කරන ලද වටිනාකම (රු.) | මූල්‍ය ප්‍රගතිය | අනුමත කිරිමට ඉතිරිව ඇති ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|---|---|
| 1 | ඒ. රාමනාදන් | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 2 | මලික් සමරවික්‍රම | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 3 | එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් | 15,000,000 | 14,850,000 | 99% | 150,000 |
| 4 | ගාමිණී විජිත් විජයමුණි සොයිසා | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 5 | ෆයිසර් මුස්තාෆා | 15,000,000 | 14,800,000 | 99% | 200,000 |
| 6 | මහින්ද සමරසිංහ | 15,000,000 | 14,992,900 | 100% | 7,100 |
| 7 | සිරිනාල් ද මෙල් | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 8 | තිලක් මාරපන | 15,000,000 | 14,999,591 | 100% | 409 |
| 9 | ලක්ෂ්මන් යාපා අබේවර්ධන | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 10 | ශාන්ති ශ්‍රීස්කන්දරාසා | 15,000,000 | 14,997,000 | 100% | 3,000 |
| 11 | කේ. දුරෙයිරත්නසිංහම් | 15,000,000 | 14,993,628 | 100% | 6,372 |
| 12 | ඩිලාන් පෙරේරා | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 13 | සරත් ෆොන්සේකා | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 14 | අනෝමා ගමගේ | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 15 | එස්. බී. දිසානායක | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 16 | කරු ජයසූරිය | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 17 | එම්. එච්. මොහොමඩ් නවාවි | 15,000,000 | 14,750,000 | 98% | 250,000 |
| 18 | ඩී. එම්. ස්වාමිනාදන් | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 19 | පී. පී. එම්. පී. ජයතිලක | 15,000,000 | 14,984,350 | 100% | 15,650 |
| 20 | තිලංග සුමතිපාල | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 21 | සරත් අමුණුගම | 15,000,000 | 14,855,000 | 99% | 145,000 |
| 22 | ජේ. වික්‍රමරත්න | 15,000,000 | 14,996,490 | 100% | 3,510 |
| 23 | එම්. එස්. තව්ෆික් | 15,000,000 | 14,931,000 | 100% | 69,000 |
| 24 | ඒ. එච්. එම්. ෆවුසි | 15,000,000 | 14,962,345 | 100% | 37,655 |
| 25 | මහාචාර්ය සී. ඒ. මාරසිංහ | 15,000,000 | 14,150,000 | 94% | 850,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | සුනිල් හඳුන්නෙත්ති | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 27 | බිමල් රත්නායක | 15,000,000 | 14,987,500 | 100% | 12,500 |
| 28 | පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ | 15,000,000 | 15,000,000 | 100% | 0 |
| 29 | එම්. එච්. එන්. සල්මන් | 15,000,000 | 14,985,000 | 100% | 15,000 |
| එකතුව | | 435,000,000 | 433,234,804 | 100% | 1,765,196 |

## 4. සංවර්ධන තොරතුරුමධ්‍යස්ථානය

සංවර්ධන තොරතුරු මධ්‍යයස්ථානය ආර්ථික සංවර්ධනය හා සැලසුම්කරණයට සහ ආශ්‍රිත විෂයන්ට අදාලව පොත්පත් හා තොරතුරු සැපයීමේ විශේෂිත පුස්තකාලයක් ලෙස ක්‍රියා කරයි. මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල නිලධාරීන්ට තොරතුරු අවශ්‍යතා සපුරාලන පුස්තකාලයක් ලෙස සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය හඳුන්වා දිය හැකිය. එසේම තොරතුරු සොයා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන්ට පර්යේෂකයන්ට මෙම ආයතනයේ සේවාව ලබා ගත හැකිය. තවද සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය සාක් රටවල තොරතුරු කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙසද කටයුතු කරයි.

**පුස්තකාල සංවිධානය**

- පිටතින් ලැබෙන සියළුම පොත්පත්, ලිපි ලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසු වන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩි දියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ලිපි ලේඛන ක්‍රමවත්ව සැකසීම.
  පොත් එකතුව නැවත ක්‍රමානුකූලව සැකසීම.

**බෙදාහැරීම්, විමසීම් හා විමර්ශනය**

- තොරතුරු අවශ්‍යතා විමසීම ගැන කටයුතු කිරිම.
- පරිගණක දත්ත උපයෝගි කරගෙන තොරතුරු ගවේශන සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතාවය අනුව පුවත්පත්, ලිපි, සඟරා සුපරීක්ෂණය කිරීම.

**අනෙකුත් සේවාවන්**

- තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ අන්තර්ජාල සමඟ සම්බන්ධ වීම.
  උදා. INSAP, E library USA
- පුවත් තොරතුරු ලබා දීමේ සේවය
- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන් හී විවිධ කාර්යයන්ට දායක වීම.

- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ජාලය සමඟ දිගටම සබඳතා පවත්වා ගැනීම.
- සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානයේ තෝරාගත් ග්‍රන්ථ සංඛ්‍යාකරණය (Digitization) ආරම්භ කිරීම.

## 5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**2016.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එස්.එස්.මුදලිගේ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 05 | සී.එස්.පෙරේරා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 06 | එන්.විජේවීර මිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 07 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 08 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 09 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 10 | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 11 | එම්.එෆ්.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 12 | ටී. ප්‍රශාන්ත් මිය | අධ්‍යක්ෂ |
| 13 | ඒ.ආර්.වික්‍රමරත්න මයා | අධ්‍යක්ෂ |
| 14 | ඒ.කේ. ගුණසේකර මයා | අධ්‍යක්ෂ |
| 15 | පී.එච්.චන්දිමා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 16 | ඩී.ඒ.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 17 | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 18 | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19 | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 20 | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 21 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 22 | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 24 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 25 | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 26 | ඩී.ඒ.සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 29 | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 31 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 32 | ඒ.ලක්ෂ්මන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 33 | ආර්.එච්.සී.කේ.රාමසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 34 | අයි.ටී.එන්.මෙන්ඩිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 35 | එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 36 | කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ |
| 37 | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 38 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 39 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 40 | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 41 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 42 | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 43 | කේ.ඒ.එච්.කේ.පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 44 | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 45 | කේ.ඒ.එම්.පී.චන්ද්‍රපාල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 46 | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 47 | ජී.රත්නාවලී මිය | සංවර්ධන නිලධාරි |
| 48 | එස්.බී.සමරසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 49 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 50 | එම්.ඩී.චන්ද්‍රා මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 51 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 52 | ඩබ්.ඩී.පී. ප්‍රනාන්දු මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 53 | ඒ.ඩී.එන්.ප්‍රියදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 54 | කේ.එල්.ඩබ්.සී.එල්.ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 55 | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 56 | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 57 | පී.එස්.ආර්.පීරිස් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 58 | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 59 | ඊ.ඒ.සී.එස්. එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 60 | පී.ධර්මසිරි මයා | විශේෂ ශ්‍රේණිය |

| | | |
|---|---|---|
| 61 | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | විශේෂ ශ්‍රේණිය |
| 62 | යූ.උපුල් රත්නකුමාර මයා | විශේෂ ශ්‍රේණිය |
| 63 | එම්.ඩී.රසාංජන ප්‍රනාන්දු මයා | කා.සේ.සේ. 1 |
| 64 | එම්.ඒ.එල්.නලින් මයා | කා.සේ.සේ. 1 |
| 65 | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| 66 | එස්.ඉරුදයරාජ් මයා | කා.සේ.සේ. 1 |
| 67 | ඩී.එම්.උපුල් කුමාර මයා | කා.සේ.සේ. 1 |
| 68 | ඩබ්.එන්.බොතේජු මහතා | කා.සේ.සේ.1 |
| 69 | එම්.වන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ. 11 |
| 70 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ. 11 |
| 71 | ඒ.එම්.ආර්.එස්.ඩී.කුමාර මයා | කා.සේ.සේ. 11 |
| 72 | ජී.එස්.රෝහණ මයා | කා.සේ.සේ. 11 |
| 73 | ඩබ්.එස්.යූ.කේ. සිල්වාමයා | කා.සේ.සේ. 11 |
| 74 | ඩබ්.ජී.එස්.බී.තෙන්නකෝන් මයා | කා.සේ.සේ. 111 |
| 75 | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු 1 |
| 76 | ඒ.විජේතුංග මයා | රියදුරු 1 |
| 77 | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |
| 78 | එච්.පී.සමරසිංහ මයා | රියදුරු 1 |
| 79 | එස්.ජයසූරියර් මයා | රියදුරු 11 |
| 80 | පී.එස්.ආනන්ද මයා | රියදුරු 11 |
| 81 | ඩබ්.එම්.එන්. කරුණාතිලක මයා | රියදුරු 11 |
| 82 | ඩී.එම්.ඩී.ශිරෝන් මයා | රියදුරු 11 |
| 83 | ඩී.බී.දිසානායක මයා | රියදුරු 11 |
| 84 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11 |
| 85 | ර්.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 11 |
| 86 | ජේ.ජී.යූ. විමලසිරි මයා | රියදුරු 11 |
| 87 | සුනිල් ලියනආරච්චි මයා | රියදුරු 11 |

**2016 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | සී.එස්.පෙරේරා මෙය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එස්.බී.සමරසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 03 | ඒ.ලක්ෂ්මන් මිය | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 04 | කේ.ඒ.එම්.පී.චන්ද්‍රපාල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 05 | ඒ.ඩී.එන්.ප්‍රියදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 1 |
| 06 | එච්.පී.සමරසිංහ මයා | රියදුරු 1 |
| 07 | ඩබ්.එන්.බොතේජු මයා | කා.සේ.සේ.1 |

**2016 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරීන්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | පී.කේ.කේ.ආර්.රාජකරුණා මිය | රා.ක.ස. 1 |
| 02 | පී.සමන් කුමාර පෙරේරා මහතා | කා.සේ.සේ. 11 |

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය**

දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය විසින් නිර්මාණය කරන ලද අතර, එම ආයතනය සමග වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට නියමිතය. වෙබ් අඩවියෙහි අන්තර්ගතය වැඩිදියුණු කරමින් භාෂා තුනෙන්ම ප්‍රවේශ විය හැකි වන පරිදි එය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**විදේශ පුහුණුව සඳහා සහභාගී වීම - 2016**

| | | |
|---|---|---|
| සංජය මුදලිගේ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් | පිලිපීනයේ පැවති Government Delegation to ADB Head Quarters වැඩසටහන<br><br>ඇමරිකා එක්සත් රාජධානියේ පැවති Harvard Kennedy School හි පැවති - Standard Courses , පාඨමාලාව<br><br>ඉන්දියාවේ පැවති Requesting foreign currency for South Asia Sub regional Economic Cooperation (SASEC) 2025 Second Regional Consultation Workshop, වැඩ සටහන.<br><br>නව දිල්ලියේ පැවති Sub regional Workshop on Data and Statistics for Sustainable Development Goals (SDGs) for South and South - West Asia ,<br><br>ඉන්දියාවේ පැවති Livelilihoods Asia Summit වැඩමුළුව | 2016.03.28සිට 30දක්වා<br><br>2016.04.24 සිට 29 දක්වා<br><br>2016.05.10. සිට 11 දක්වා<br><br>2016.09.05 සිට 09 දක්වා<br><br>2016.1207 සිට 08 දක්වා |
| මලර්මදී ගංගාදරන් මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ඉන්දුනීසියාවේ පැවති G2G Meeting Regional Dialogue with Partner governments on SDGs Implementation, වැඩ සටහන<br><br>තියාලන්තයේ පැවති Regional Capacity Building | 2016.05.16<br><br>2016.10.06 සිට |

| | | |
|---|---|---|
| | Workshop on SDG Monitoring in Asia and the Pacific - වැඩ සටහන . | 07 දක්වා |
| ශිරන්ති රත්නායක මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | මැක්සිකෝවේ ලොස් කාබෝස්හි පැවති BIOFIN 2nd Global Workshop වැඩසටහන<br><br>Sඉන්දුනීසියාවේ පැවති overeign Climate Risk Transfer Executive Programme for Policymakers- වැඩසටහන | 2016.04.12 සිට 14 දක්වා<br><br>2016.10.17 සිට 19 දක්වා |
| කේ.ඩී.එස්.ආර්. පෙරේරා මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | චීනයේ පැවති Ministerial Workshop on Development Model for Developing Countries වැඩසටහන | 2016.05.26 සිට ජූනි 01 දක්වා |
| දර්ශණී ප්‍රශාන්ත් මිය<br>අධ්‍යඛ්ෂ (පාලන) | චීනයේ පැවති Seminar on Regional Planning & Sustainable development for Developing Countries වැඩසටහන | 2016.05.12 සිට 25 දක්වා |
| චන්ද්‍රකා සේනානායක මිය<br>අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති The 7th Regional Training Course on Mainstreaming Disaster Risk Reduction into National Development Processes වැඩ සටහන | 2016 මැයි 23 සිට 27 දක්වා |
| ටී.ඒ.ඩී. ඩී. ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ | මාලදිවයිනේ පැවති South Asia Sub regional Economic Cooperation (SASEC) Fifth Customs Subgroup Meeting, වැඩසටහන<br><br>මලයාසියාවේ පැවති Study visit to the Ministry of Education and secondary Schools in Malaysia on Technological Education වැඩසටහන<br><br>තායිලන්තයේ පැවති Program for (P for R) Training Program for Clients වැඩසටහන | 2016 මැයි 25 සිට 26 දකවා<br><br>2016.09.18 සිට 24 දක්වා<br><br>2016.12.12 සිට 14 දක්වා |
| ටී.එම්.ජේ.බණ්ඩාර මහතා<br>අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පැවති Seminar on Macroeconomic Management for Senior Officials වැඩසටහන | 2016.05.23 සිට 27 දක්වා |
| එම්.එෆ්.ඒ. මුබාරක් මහතා<br>අධ්‍යක්ෂ | ඉන්දුනීසියාවේ පැවති The Biodiversity Finance Initiative (BIOFIN) Project Regional Workshop වැඩසටහන<br><br>ඉතාලියේ පැවති "Understanding Risk" Forum වැඩසටහන<br><br>තායිලන්තයේ පැවති Regional Knowledge<br><br>Exchanges Implementing the 2030 Agenda for Sustainable Development on & Linking Development Finance with the SDGs : Consultation for the Second High Level Meeting of the Global Partnership for Effective Development Cooperation - වැඩසටහන | 2016.03.02 සිට 04 දක්වා<br><br>2016.05.16 සිට 20 දක්වා<br><br>2016 .10.24 සිට<br><br>25 දක්වා<br>2016.05.26 සිට 27 දක්වා |
| ඒ ආර් වික්‍රමරත්න මහතා | පිලිපීනයේ පැවති Second Asian Irrigation Forum ADB HQ, වැඩසටහන | 2016.01.22 සිට |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති 72nd Session of the and Social Commission for Asia and the Pacific (UNESCAP) වැඩසටහන<br><br>ඉන්දුනිසියාවේ පැවති Sovereign to Climate Risk Transfer Executive Programme for Policymakers - වැඩ සටහන | 23 දක්වා<br><br>2016.05.15 සිට 19 දක්වා<br><br>2016.10.17 සිට 19 දක්වා |
| ඒ.කේ.ගුණසේකර මිය<br>අධ්‍යක්ෂ | ඉන්දියාවේ නවදිල්ලියේ පැවති Inter-governmental Meeting to discuss the Progress of the study on south Asia Sub regional Economic Cooperation (SASEC) Cross-Border Electricity Transmission Master Plan and SASEC Regional Workshop on Technical and Regulatory Challenges in Cross-Border Electricity Transmission Interconnections, වැඩසටහන | 2016.04.08 සිට 09 දක්වා |
| පී.එම්. එස්. ජයතිලක මහතා<br>සහකාර අධ්‍යක්ෂ | හොංකොං හි පැවති Executive Training Programme on Macroeconomic polices at the University of Hong Kong වැඩසටහන | 2016 අගෝස්තු |
| කේ.එන්.පී. ජයරත්න මහතා<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Project Financing, Development & Management of Public Infrastructure for Developing Countries in Yangling, Shaanxi Province, වැඩසටහන | 2016.05.10 සිට 30 දකවා |
| ටී.එම්.ඩී. පරාක්‍රම තෙන්නකෝන් මහතා<br>සහකාර අධ්‍යක්ෂ | නේපාලයේ කත්මන්ඩු නුවර පැවති South Asia Sub Regional Economic Cooperation (SASEC) Sub regional Mechanism Meeting වැඩසටහන | 2016.06.08 සිට 09 දක්වා |
| ඩබ්. ලක්මිණි ප්‍රියන්ති ප්‍රනාන්දු මිය<br>සහකාර අධ්‍යක්ෂ | සින්ගප්පූරුවේ පැවති Course on Financial Programming and Policies at IMF - Singapore Regional Training Institute (STI) Singapore - වැඩසටහන<br><br>සිංගප්පූරුවේ පැවති Seminar Macroeconomic Management and Financial Sector Issues වැඩසටහන | 2016.02.22 සිට 2016.03.04 දක්වා<br><br>2016.05.02 සිට 13 දක්වා |
| රජිතා කිසාගෝතමී ලංකාතිලක මිය<br>සහකාර අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ පැවැත්වෙන පශ්චාත් උපාධි Scholarship to study MSc Climate Justice (FT) at the, Glasgow Caledonian University, පාඨමාලාව | 2017-2018 |
| ටී.වයි.එල්. මුණසිංහ මිය<br>සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති 5th Regional Workshop on "Risk Sensitive Planning" වැඩසටහන | 2016.08.02 සිට 04 දක්වා |
| කේ.ජී.ආර්.ජී.ආර්. වික්‍රමවර්ධන මහතා<br>සහකාර අධ්‍යක්ෂ | හොංකොං හි පැවති Executive Training Programme on Macroeconomic polices at the University of Hong Kong වැඩසටහන | 2016 අගෝස්තු |
| ආර්.ඩී. අසංක මෛත්‍රිරත්න මහතා<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති "Seminar on Macroeconomic Development and Planning for the Belt and Road" countries වැඩසටහන | 2016.05.13 සිට 2016.06.02 දක්වා |

| | | |
|---|---|---|
| ඩී.ඒ.සී. දිලානි පීරිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | හොංකොං හි පැවති Executive Training Programme on Macroeconomic polices at the University of Hong Kong වැඩසටහන | 2016 අගෝස්තු |
| දිනූෂි අනුපමා මනෝරත්න මිය<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති International Joint Program on Infrastructure Planning and Economic Development under Asian Economic Integration, which will be held in Metro වැඩසටහන | 201609.26 සිට 30 දක්වා |
| කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මිය<br>සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති Invitation to participate in a Regional Knowledge Exchange on REDD+ Financing Westin Grande Sukhumi Hotel , වැඩසටහන | 2016.05.25 සිට 27 දක්වා |
| යූ.ඒ.ඩබ්.එල්. සුමනසේකර මිය<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති International Joint Program on Infrastructure Planning and Economic Development under Asian Economic Integration, which will be held in Metro Manila, between වැඩසටහන | 2016.09.26 සිට 30 දක්වා |
| පී.ඒ නිලූෂා අබේසේකර මෙය<br>සහකාර අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පැවති Singapore - Korea Comprehensive Joint Development Cooperation Partnership : Public Private Partnerships in Emerging Economics, වැඩසටහන | 2016.10.10 සිට 14 දක්වා |
| කේ.ඒ.එච්.කේ. පෙරේරා මිය<br>සහකාර අධ්‍යක්ෂ | ඉන්දියාවේ පැවති Climate Change and Disaster and Risks Management (CCDRM) in Planning and Investment, වැඩසටහන | 2016.06.27 සිට 29 දක්වා |
| එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය<br>සහකාර අධ්‍යක්ෂ | මලයාසියාවේ පැවති Developing and Managing E Library වැඩසටහන | 2016.08.08 සිට 21 දක්වා |
| නුවන්ගි කෞෂාල්‍යා හෙට්ටිආරච්චි මිය<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති International Joint Program on Infrastructure Planning and Economic Development under Asian Economic Integration, වැඩසටහන | 26th to 30th September 2016.09.26 සිට 30 දක්වා |
| අහල්‍යා ලක්ෂ්මන් මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Economic Diplomacy for Asian and European Countries, වැඩසටහන | 2016.09.02 සිට 22 දක්වා |
| ආර්.එච්.සී.කේ.රාමසිංහ මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Seawater Desalination & Comprehensive Utilization for Developing Countries 2016 වැඩසටහන | 2016.04.27 සිට 2016.05.17 දක්වා |
| කේ.ඒ. එම්.පී චන්ද්‍රපාල මහතා<br>සහකාර අධ්‍යක්ෂ | දකුණු කොරියාවේ පැවැත්වෙන පශ්චාත් උපාධි Development Cooperation Policy Program (DCPP) at the Graduate School of International Studies, පාඨමාලාව | 2016-2017 |

## මූල්‍යකාර්යසාධනය - 2016

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගනකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන් කරන ලද ප්‍රතිපාදන සහ මුළු වියදම, පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙහි නම | 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | සත්‍ය වියදම (රුපියල්) | වියදමෙහි ප්‍රතිශතය (%) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | සත්‍ය වියදම (රුපියල්) | වියදමෙහි ප්‍රතිශතය (%) |
| පුනරාවර්තන | 76,110,000.00 | 68,486,950.40 | 89.98 | 88,163,000.00 | 76,640,316.74 | 86.93 |
| මූලධන | 15,600,000.00 | 13,025,664.15 | 83.50 | 6,873,458.00 | 5,836,839.39 | 84.92 |
| එකතුව | **91,710,000.00** | **81,512,614.55** | **88.88** | **95,036,458.00** | **82,477,156.13** | **86.78** |